# Project 202
# 202 වන ව්‍යාපෘතිය

DP EDUCATION

**Coding School**






වෙබ් පිටුව බලන්න


Glitch ආරම්භ කරන්න

LIVEWORKSHEETS

# <u>HTML සහ CSS භාවිතයෙන් Portfolio වෙබ් පිටුවක් නිර්මාණය කරන ආකාරය බලමු.</u>

- ❖ මේ සඳහා ඔබට live worksheet තුළ ලබා දී ඇති ආරම්භ කරන්න ලෙස සඳහන් link එක භාවිතා කරන්න.
- ❖ මෙම ව්‍යාපෘතිය අධ්‍යනය කිරීම තුළින් background එකට image එකක් එක් කර ගන්නා ආකාරය පිළිබඳව සහ navigation bar එකක් නිර්මාණය කර ගන්නා ආකාරය පිළිබඳව දැනුම ලබා ගත හැකි වේ.

- ❖ මෙම ව්‍යාපෘතිය අධ්‍යනය කිරීම මඟින් පහත පරිදි වෙබ් පිටුවක කොටසක් නිර්මාණය කර ගත හැකි වේ.




LIVEWORKSHEETS

❖ අපි දැන් මෙම ව්‍යාපෘතියට අදාළ HTML කොටස නිර්මාණය කරමු.

❖ පළමුවෙන්ම index.html file එක තුළ මූලික වශයෙන් අවශ්‍ය වන tags පහත පරිදි නිර්මාණය කර ගත යුතු වේ.

index.html PRETTIER

```html
<!DOCTYPE html>
<html lang="en">
 <head>
    <title>Personal Portfolio Website</title>
 </head>
 <body>

 </body>
</html>
```

❖ ඔබ style file තුළ නිර්මාණය කර ගන්නා කොටස html file එකට add කර ගැනීමට head tag එක තුළ link tag එක පහත පරිදි නිර්මාණය කර ගන්න.

```html
<link rel="stylesheet" href="style.css">
```

❖ එවිට සම්පූර්ණ එක පහත පරිදි දිස් වෙයි.

index.html PRETTIER

```html
<!DOCTYPE html>
<html lang="en">
<head>
    <title>Personal Portfolio Website</title>
    <link rel="stylesheet" href="style.css">
</head>
<body>
</body>
</html>
```

❖ අපි දැන් navigation bar එක නිර්මාණය කිරීමට අදාළ tags නිර්මාණය කරමු.

❖ navigation bar එක නිර්මාණය කිරීමට අදාළ tags සියල්ල body tag තුළ නිර්මාණය කරනු ලබයි.

LIVEWORKSHEETS

- ❖ මුලින්ම div tag එකක් නිර්මාණය කර ගන්න.එම div tag එක තුළට header ලෙස class එකක් නිර්මාණය කරන්න.
- ❖ header class එක නිර්මාණය කර ගත් div tag එකට තුළ තවත් div tag එකක් නිර්මාණය කර ගන්න. එම div tag එක තුළ container ලෙස class එකක් නිර්මාණය කරන්න.
- ❖ ඊට අදාළ div tags පහත දැක්වේ.

```
<div class="header">
    <div class="container">

    </div>
</div>
```

- ❖ container ලෙස class එක ඇතුළත් div tag එක තුළ nav tag එකක් නිර්මාණය කර ගන්න.
- ❖ nav tag එක navigation bar එකක් නිර්මාණය කර ගැනීමට භාවිතා කරයි. navigation bar යනුවෙන් හඳුන්වනු ලබන්නේ වෙබ් අඩවියේ අනෙකුත් කොටස් වෙත සබැඳි අඩංගු වෙබ් පිටුවක් තුළ ඇති පරිශීලක අතුරුමුහුණත් කොටස් ය.
- ❖ එලෙස නිර්මාණය කර ගත් nav tag එක තුළට img tag එකක් නිර්මාණය කර ගන්න.එම img tag එකෙහි src සඳහා assets තුළ ඇති logo.png මත click කර එම පිංතූරයේ copy URL මත click කරමින් Url එක copy කර ගන්න.එම url එක src සඳහා එක් කර ගන්න.




- ❖ යම් හේතුවකින් මෙම පිංතූරය load නොවුනහොත් logo ලෙස සඳහාන් වීමට code සකස් කරන්න.
- ❖ තවද මෙම පිංතූරය සඳහා logo ලෙස class එකක් එක් කර ගන්න.
- ❖ ඊට අදාළ code පහත පරිදි සකස් කර ගන්න.

LIVEWORKSHEETS

```
<nav>
    <img src="https://cdn.glitch.global/c02a25d2-4bef-443a-a607-9ffbae5678c0/logo.png?v=1704280927714" alt="logo" class="logo">

</nav>
```

- දැන් අපි list එකක් නිර්මාණය කර ගනිමු.ඒ සඳහා මුළින්ම ul tag එකක් නිර්මාණය කර ගන්න.

- පසුව එම ul tag එක තුළ li tags එක් කරමින් list එක සඳහා එක් කර යුතු දේවල් එක් කර ගන්න.

- මෙහිදී මුළින්ම එක් කර ගන්නා li tag තුළ a tag එකක් එක් කර ගන්න.මෙම a tag එකට href යටතේ link එකක් එක් කර ගත යුතු වේ. එම link එක එක් කර ගත යුතු අයුරු පසු ව්‍යාපෘති තුළදී එක් කර ගනිමු.මෙම a tag අතරට Home ලෙස සඳහන් කරන්න.

- ඉහත ආකාරයටම li tag එකක් සකස් කර ඒ තුළ a tag එකක් නිර්මාණය කර ගන්න.එම a tag එක තුළ About ලෙස ලබා දෙන්න.

- ඉහත ආකාරයටම li tag එකක් සකස් කර ඒ තුළ a tag එකක් නිර්මාණය කර ගන්න.එම a tag එක තුළ Services ලෙස ලබා දෙන්න.

- ඉහත ආකාරයටම li tag එකක් සකස් කර ඒ තුළ a tag එකක් නිර්මාණය කර ගන්න.එම a tag එක තුළ Portfolio ලෙස ලබා දෙන්න.

- ඉහත ආකාරයටම li tag එකක් සකස් කර ඒ තුළ a tag එකක් නිර්මාණය කර ගන්න.එම a tag එක තුළ Contact ලෙස ලබා දෙන්න.

- ඊට අදාළ code පහත පරිදි සකස් කර ගන්න.

```
<ul>
    <li><a href="">Home</a></li>
    <li><a href="">About</a></li>
    <li><a href="">Services</a></li>
    <li><a href="">Portfolio</a></li>
    <li><a href="">Contact</a></li>
</ul>
```

LIVEWORKSHEETS

❖ මෙම කොටසට අදාළ සම්පූර්ණ HTML කොටස පහත පරිදි දිස් වේ.

```html
<!DOCTYPE html>
<html lang="en">
<head>
    <title>Personal Portfolio Website</title>
    <link rel="stylesheet" href="style.css">
</head>
<body>
    <div class="header">
        <div class="container">
            <nav>
                <img src="https://cdn.glitch.global/c02a25d2-4bef-443a-a607-9ffbae5678c0/logo.png?v=1704280927714" alt="logo" class="logo">
                <ul>
                    <li><a href="">Home</a></li>
                    <li><a href="">About</a></li>
                    <li><a href="">Services</a></li>
                    <li><a href="">Portfolio</a></li>
                    <li><a href="">Contact</a></li>
                </ul>
            </nav>
        </div>
    </div>
</body>
</html>
```

❖ මෙම ව්‍යාපෘතියට අදාළ CSS කොටස පහත පරිදි සකස් කරමු.

❖ මෙම මුළු web page එකටම අදාළව margin, padding, font-family සහ box-sizing ආදිය වෙනස් කිරීමට පහත පරිදි css සකස් කර යුතු වේ.මෙහිදී * ලකුණ එක් කර ගනු ලබන්නේ මුළු පිටුවටම අදාළ වෙනස් විය යුතු ගුණාංග එක් කිරීමේදී ය.ඊට අදාළ css පහත පරිදි සකස් කර ගත යුතු වේ.

```css
*{
    margin: 0;
    padding: 0;
    font-family:'Poppins', sans-serif;
    box-sizing: border-box;
}
```


❖ body සඳහා background color සහ font color සඳහා පහත CSS පරිදි සකස් කරන්න.

❖ background color සඳහා #080808 code එකට අදාළ color එක ලබා දෙන්න. font color සඳහා #fff code එකට අදාළ color එක ලබා දෙන්න.

```css
body{
    background: #080808;
    color: #fff;
}
```

LIVEWORKSHEETS

- header ලෙස සකස් කර ගන්නා class එක සඳහා width, height, background image, background size, background position එක පහත පරිදි සකස් කරන්න.
- Background image එකට අදාළ url එක assets තුළ ඇති background.png මත click කර එම පිංතූරයේ Url එක copy කර ගන්න. එම url එක url සඳහා එක් කර ගන්න.




```css
.header{
    width: 100%;
    height: 100vh;
    background-image: url(https://cdn.glitch.global/c02a25d2-4bef-443a-a607-9ffbae5678c0/background.png?v=1704280929958);
    background-size: cover;
    background-position: center;
}
```

LIVEWORKSHEETS

❖ container ලෙස සකස් කර ගන්නා class එක සඳහා පහත පරිදි css සකස් කර ගන්න.

```
.container{
    padding: 10px 10%;
}
```

❖ nav tag වලට ආළ css පහත පරිදි සකස් කරන්න.

```
nav{
    display: flex;
    align-items: center;
    justify-content: space-between;
    flex-wrap: wrap;
}
```

❖ logo ලෙස සකස් කර ගන්නා class එක පහත පරිදි css සකස් කර ගන්න.

```
.logo{
    width: 140px;
}
```

❖ nav tag එක තුළ තිබෙන ul tag වල li tag වල පහත පරිදි Css සකස් කර ගන්න. මෙහි display, list-style සහ margin සඳහා css සකස් කරනු ලබයි.

```
nav ul li{
    display: inline-block;
    list-style: none;
    margin: 10px 20px;
}
```

❖ nav tag එක තුළ තිබෙන ul tag තුළ li tag ඇත.එම li tag තුළ ඇති a tag සඳහා පහත පරිදි Css සකස් කර ගන්න.

❖ මෙහිදී එම a tag තුළ ඇති text එකෙහි font color සඳහා #fff code එකට අදාළ color එක ලබා දෙන්න. Link වල යටින් එන line එක ඉවත් කිරීමට text decoration සකස් කර යුතු වේ.font size එක 18px ලෙස ලබා දෙන්න.

```
nav ul li a{
    color: #fff;
    text-decoration: none;
    font-size: 18px;
}
```

LIVEWORKSHEETS